සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
Ministry of Women, Child Affairs and Social Empowerment

මගේ අංකය / எனது இல / My No: DSD/HO/04/PM/04/E.Power
ඔබේ අංකය / உமது இல / Your No: ............
දිනය / திகதி / Date: 2024.02.08

**සමෘද්ධි චක්‍රලේඛ අංක:- 2024/02**

**සියළුම දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,**
**දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්/නියෝජ්‍ය හා සහකාර අධ්‍යක්ෂවරුන්,**
**ප්‍රාදේශීය ලේකම්වරුන්,**

**"සුභසාධක රාජ්‍යයෙන්, ව්‍යවසායක රාජ්‍යයක් වෙත පියමං කරන ප්‍රජාවක් බිහි කිරීම"**

**"අස්වැසුම" සුභසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභී පවුල් සවිබලගැන්වීමේ වැඩසටහන - 2024**

## 01. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය අවම කිරීම සඳහා සුභසාධක වැඩසටහන් රැසක් කාලයෙන් කාලයට ක්‍රියාත්මක කර ඇත. මෙම සුභසාධක වැඩසටහන් අතරින්, සමෘද්ධි සංවර්ධන වැඩසටහන පුළුල් සංවිධාන ජාලයක් සහිතව, ත්‍රිවිධ සංවර්ධන ප්‍රවේශයක් ඇතිව වසර 29 කට ආසන්න කාලයක් දිවයිනම ආවර්ණය වන පරිදි ක්‍රියාත්මක විය.

සමෘද්ධි වැඩසටහන යටතේ, දිළිඳුකමෙන් හා අවාසිදායක තත්ත්වයෙන් පෙළෙන ජනතාව මුහුණ පා ඇති ආර්ථික, සාමාජීය, නෛතික, මානසික ආදි බහුවිධ අර්බුදයන් නිවැරැදිව හඳුනා ගනිමින් ඒවා අවම කර, ආර්ථික, සාමාජීය, නෛතික හා මානසික සුවතාවය සාක්ෂාත් කිරීම සඳහා ආදායම් උත්පාදන වැඩසටහන් ඇතුළු වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන ලදි.

2023 වර්ෂයේ සිට නව සුභසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් පිළියෙල කොට ක්‍රියාත්මක කිරීමේ වගකීම සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය වෙත පවරා ඇත. ඒ අනුව, සමාජ කාණ්ඩ 4ක් යටතේ දිවයින පුරා හඳුනාගත් පවුල් ලක්ෂ 20 ක් සඳහා අස්වැසුම සුභසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය නමින් නව වැඩසටහනක් හඳුන්වා දෙන ලදි. නමුත්, 2024 වර්ෂයේ සිට අස්වැසුම සුභසාධක ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව ලක්ෂ 24 දක්වා වැඩි කිරීමට දැනට රජය තීරණය කර ඇත.

අස්වැසුම සුභසාධක ප්‍රතිලාභි යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබන සමාජ කණ්ඩායම් 04 කට අයත් පවුල් අතරින් අන්ත දිළිඳු හා දුප්පත් සමාජ කණ්ඩායම් වලට අයත් පවුල්, ඉදිරි වසර 3 ක් තුළ සවිබලගන්වා සහනාධාර යැපුම් මානසිකත්වයෙන් මුදවා ගැනීමට ආදාළව වගකීම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පවරමින් මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වන, ගරු.ජනාධිපතිතුමන් විසින් 2023.04.17 හා 2023.09.25 දින වල පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීම් සඳහා ඉදිරිපත් කරන ලද, අංක අමප/23/0730/604/073 හා අමප/23/1811/604/178 දරණ අමාත්‍ය මණ්ඩල සංදේශ මගින් අනුමැතිය ලබාගෙන ඇත.

එමෙන්ම, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ගේ අංක NP/PP/SOC/EMP/2023/2 දරණ 2023.10.24 හා 2024.01.05 දිනැති ලිපි හා අංක NP/SOC/CM/COM/2024 දරණ 2024.02.02 දිනැති ලිපිය මඟින්, අන්ත දිළිඳු හා දුප්පත් සමාජ කණ්ඩායම්වලට අමතරව සංක්‍රාන්ති හා අවදානමට ලක් වූ ප්‍රතිලාභී පවුල් ද සවිබලගැන්වීමේ වැඩසටහනට ඇතුලත් කරගැනීමට යෝජනා කර ඇත.



1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

Tel- / Fax - / E-mail-

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General: 011-2872202, 011-2889002, dgsamurdhi@gmail.com

අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment): 011-2873799, 011-2873996, diradmin@samurdhi.gov.lk, Hot Line :0112-889007

ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant: 011-2869742, 011-2869742, finance@samurdhi.gov.lk

අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance): 011-2889003, 011-2887469, Hot Line:0112-885582

කාර්යාලය / அலுவலகம் / Office: 0112872202, Hot Line: 011- 2887722

ඒ අනුව, දැනට අස්වැසුම සුභසාධක ප්‍රතිලාභී යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබන ප්‍රතිලාභීන් අතරින් 2024 වර්ෂයේ පවුල් ඒකක 300,000 සවිබලගැන්වීමට තෝරා ගැනීමත්, තෝරා ගත් පවුල් වෙනුවෙන් පවුල් සංවර්ධන සැලසුම් සකස් කිරීමට සූදානම් වීම, ප්‍රතිලාභීන්ගේ අවශ්‍යතා හා සැලසිය යුතු සේවාවන් හඳුනාගැනීම, වැනි කරුණු සම්බන්ධව උපදෙස් හා මගපෙන්වීමට මෙම චක්‍රලේඛ උපදෙස් නිකුත් කරන බව කාරුණිකව දන්වමි.

## 02.අරමුණ

### 1.ප්‍රධාන අරමුණ

අස්වැසුම සුභසාධක ප්‍රතිලාභී යෝජනා ක්‍රමය යටතේ, ප්‍රතිලාභ ලබන සමාජ කාණ්ඩායම් 04 අයත් පවුල් ඒකක වල ගෘහමූලිකයා ඇතුළු අනිකුත් සාමාජිකයින්ව මානසික, ආර්ථික, සාමාජීය, ප්‍රධාන ක්ෂේත්‍ර මෙන්ම ඊට සමගාමීව, අධ්‍යාපනික, පාරිසරික හා නෛතික යන අනු ක්ෂේත්‍ර වලින් පූර්ණ සවිබලගන්වා, ඔවුන්ව වසර 03 ක් ඇතුලත බලගැන්විම ප්‍රධාන අරමුණ වේ.

### 2.සුවිශේෂ අරමුණු

I. දුප්පත් හා අන්ත දිළිඳු සමාජ කණ්ඩායමට අයත් පවුල් ඒකක යැපුම් මානසිකත්වයෙන් මුදවා ගැනීමට කටයුතු කිරීම.
II. සංක්‍රාන්තික හා අවදානම් සහිත සමාජ කණ්ඩායම්වලට අයත් ප්‍රතිලාභීන් ද සවිබලගන්වා ඔවුන්ගේ ආර්ථික අංශය තිරසාර කිරීම.
III. ක්ෂුද්‍ර, හා කුඩා පරිමාණ ව්‍යවසායකයින්/ගොවීන් බිහිකිරීමට කටයුතු කර, ජාතික නිෂ්පාදනය ඉහල නැංවීමට කටයුතු කිරීම.
IV. නිෂ්පාදන සඳහා දේශීය හා විදේශීය වෙළඳපල අවස්ථාවන් පුළුල් කර දීම.
V. සවිබලගැන්විම් වැඩසටහන යටතේ ප්‍රතිලාභ ලබන පවුල්වල සිටින තරුණ/තරුණියන් සඳහා දේශීය හා විදේශ රැකියා අවස්ථා ලබා කරදීම.
VI. දුප්පත්කම නිසා ආර්ථික පීඩනයට ලක්ව ඇති කාන්තාවන්, සවිබලගැන්වීමේ වැඩසටහනට ඇතුළත් කර , පහසුකම් සැලසීමේදී ඔවුන්ට ප්‍රමුඛතාවය ලබාදීම.
VII. ස්වශක්තියෙන් නැගී සිටින ජනතාවක් බිහි කිරීමට මානසික ශක්තිය ඇති කිරීම.
VIII. ආබාධිත, වැඩිහිටි හා රෝගී තත්ත්වයෙන් පෙළෙන පුද්ගලයින්ව මානසික, සාමාජීය හා සෞඛ්‍ය ක්ෂේත්‍ර වලින් බලගැන්වීමට කටයුතු කර, සංතෘප්ත වූ පුද්ගලයින්ව බිහි කිරීම.

## 03. ඉලක්කය:-

### 3.1 ජාතික ඉලක්කය

2024 වර්ෂයේ පවුල් සවිබලගැන්වීමේ ඉලක්කය, ප්‍රතිලාභී පවුල් 300,000 ක් වේ. අස්වැසුම සුභසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබන සෑම සමාජ කණ්ඩායමක්ම නියෝජනය වන පරිදි, මෙම ඉලක්ක ප්‍රතිලාභී පවුල් තෝරා ගැනීමට කටයුතු කෙරේ.

3.2.සැලසුමට අනුව, 2024 වර්ෂයේ තෝරා ගන්නා පවුල් 300,000 ආර්ථික, සමාජීය හා මානසික අංශවලින් අවු.03 කාලය ඇතුලත සවිබලගැන්වීමට අවශ්‍ය වැඩසටහන් හා ව්‍යාපෘති හඳුනාගෙන ක්‍රියාත්මක කර, තිරසාර ආදායම් මාර්ගයක් ඇතිකර දීම හා එම පවුල් සහනාධාර මානසිකත්වයෙන් මුදවා ගැනීමට කටයුතු කළ යුතුය.

### 3.4. දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය, ග්‍රාම නිලධාරි වසම් මට්ටමට ඉලක්ක සකස් කර ලබාදීම.

i. එක් එක් දිස්ත්‍රික්කය හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය විසින් 2024 වර්ෂයේ සවිබලගැන්විය යුතු ඉලක්ක පවුල් සංඛ්‍යාව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ගනනය කර, ඇමුණුම -01 සමඟ ඉදිරිපත් කර ඇත. ඔබ දිස්ත්‍රික්කය / ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට වෙන් කර ඇති ඉලක්ක පවුල් සංඛ්‍යාව මෙම වර්ෂයේ සිට ඉදිරි වර්ෂ 03 තුල සවිබලගැන්වීමට කටයුතු සිදු කල යුතුය.

ii. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට ලබා දී ඇති පවුල් සංඛ්‍යාවට නොඅඩු වන පරිදි, ප්‍රාදේශීය ලේකම් විසින් කොට්ඨාශයේ සියළුම ග්‍රාම නිලධාරි වසම් සඳහා ඉලක්ක පවුල් සංඛ්‍යාව ගනනය කර සමෘද්ධි සංවර්ධන නිලධාරි වෙත ලබා දිය යුතුය. එහිදි සෑම අස්වැසුම සුභසාධක ප්‍රතිලාභි සමාජ කණ්ඩායමක ප්‍රතිලාභි පවුල් ඇතුලත් වන පරිදි ඉලක්ක පවුල් ගනනය කිරීම කල යුතුය.

## 04. 2024 සවිබලගැන්වීමේ වැඩසටහන ආරම්භ කිරීම හා පියවරයන්

**4.1** මෙම චක්‍රලේඛ උපදෙස් සෑම නිළධාරියකුම වෙත ලබාදිම හා දැනුවත් කිරීම කල යුතුය.

**4.2** ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින්, ග්‍රාම නිළධාරි වසම් සඳහා ඉලක්ක සකස් කර දීම සිදුකල යුතුය.

**4.3** දී ඇති නිර්ණායකට අනුව, ග්‍රාම නිළධාරි වසම් මට්ටමින් සවිබලගැන්වීම සඳහා සුදුසු ප්‍රතිලාභීන් තෝරා ගැනීම හා ලේඛණ සකස් කර ගත යුතුය.

**4.4** තෝරාගත් ප්‍රතිලාභීන් වෙනුවෙන් පවුල් සංවර්ධන සැලසුම් සකස් කිරීම සඳහා හඳුන්වා දී ඇති අකෘතින් **(ඇමුණුම 2(i) හා 2(ii))** භාවිතා කර තොරතුරු හා දත්ත රැස් කල යුතුය.

**4.5** ඉන් අනතුරුව, එක් එක් පවුල වෙනුවෙන් පවුල් සංවර්ධන සැලසුම සකස් කිරීම සිදු කල යුතු අතර, ඒ සම්බන්ධව ඉදිරියේ දි දැනුම් දීමට නියමිතය.

## 05. 2024 වර්ෂයේදි,සවිබලගන්වන ප්‍රතිලාභී පවුල හඳුනාගැනීමට සලකා බැලිය යුතු කරුණු

ග්‍රාම නිළධාරි වසමට ලබා දී ඇති ඉලක්ක පවුල් සංඛ්‍යාව සඳහා සුදුසු ප්‍රතිලාභීන්ව හඳුනා ගැනීම සමෘද්ධි සංවර්ධන නිළධාරී විසින් කල යුතුය. එහිදි, තම රාජකාරි බල ප්‍රදේශයේ සිටින අස්වැසුම සුභසාධක ප්‍රතිලාභීන් අතරින් පහත සුදුසුකම් සියල්ලම හෝ වැඩි සංඛ්‍යාවක් සම්පූර්ණ කර ඇති හෝ සම්පූර්ණ කරන පවුල සවිබලගැන්වීමට තෝරා ගත යුතුය.

1. අස්වැසුම සුභසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ, ප්‍රතිලාභ ලබන සමාජ කාණ්ඩායමකට අයත් පවුලක්/ පුද්ගලයෙකු වීම.

2. දැනටමත් ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් පවත්වා ගෙන යන හෝ නව ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට සැලසුමක් / හැකියාවක් / පුහුණුවක් ඇති පුද්ගලයකු හෝ සමාජිකයින් සිටින පවුලක් වීම.

3. පුහුණුවකින් පසුව, දේශීය / විදේශීය රැකියාවකට හෝ ස්වයං රැකියාවකට යොමු කල හැකි අවිවාහක තරුණ තරුණියන් සිටින පවුලක් වීම.

4. ආර්ථික සවිබලගැන්වීම තුළින් මාසිකව රු.30,000 හෝ ඊට වැඩි ආදායමක් උපයන ස්වයං රැකියාලාභියකු/ගොවියකු/රැකියාලාභියකු හෝ ඒ සඳහා ශක්‍යතාවයක් ඇති පවුලක් / අයෙකු වීම.

5. සමෘද්ධි බැංකු ණය ලබා ගැනීමට අපේක්ෂා කරන ප්‍රතිලාභියකු නම්, ප්‍රජාමූල සංවිධානයේ හා සමෘද්ධි බැංකුවේ සාමාජිකත්වය හිමි අයෙකු වීම හා ණය ලබා ගැනීමට සුදුසුකම් ඇති/සම්පූර්ණ කලහැකි පවුලක් / පුද්ගලයෙකු වීම.

## 06. සවිබලගන්වන පවුල් සඳහා පවුල් සංවර්ධන සැලැස්ම සඳහා තොරතුරු/ දත්ත රැස්කිරීම.

ඉහත ඡේද අංක 05 සඳහන් උපදෙස් මත තෝරා ගන්නා, එක් එක් ප්‍රතිලාභියා වෙනුවෙන් පවුල් සංවර්ධන සැලැස්ම සකස් කිරීම සම්බන්ධව උපදෙස් පහත වේ.

1. පවුල් සංවර්ධන සැලැස්ම සකස් කිරීමට තොරතුරු රැස් කිරීමට ඇමුණුම - 02(i) හා 02(ii) ආකෘති භාවිතා කල යුතුය.

2. සමෘද්ධි සංවර්ධන නිළධාරින් විසින්, තෝරාගත් ප්‍රතිලාභියාගේ නිවසට/ ව්‍යපෘති ස්ථානයට ගොස් නිරීක්ෂනය හා සම්මුඛ සාකච්ජා මගින් තොරතුරු රැස් කිරීම කලයුතුය.
3. රැස් කල තොරතුරු/දත්ත අනුව, පුහුණුව, දැනුම, මූල්‍යාධාර / ද්‍රව්‍ය ආධාර, ණය පහසුකම්, උපදේශන සේවා හා වෙනත් සේවා සැලසිය යුතු ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු ඇතුලත් ලේඛණ සකස් කර ගත යුතුය.
4. තොරතුරු රැස්කිරීමට අවශ්‍ය අකෘති පත්‍ර, ප්‍රජාමුල සංවිධාන/ප්‍රාදේශීය සංවිධාන අරමුදලකින් මුද්‍රණය කර ග්‍රාම නිළධාරි වසම් වලට ලබාදිය යුතුය. වියදම් දැරිමේ දී ප්‍රාදේශීය සංවිධානයේ එකඟතාවය ගත යුතුය. මෙම කාර්යය බැංකු සමිති කළමනාකරු විසින් සම්බන්ධීකරණය කල යුතුය.

**07. පවුල් සවිබලගන්වන, ප්‍රධාන ක්ෂේත්‍රයන් හා ඊට අදාල වැඩසටහන් හඳුන්වා දීම.**

ක්ෂේත්‍රයන් හා කාර්යභාරය

1. මානසික සවිබලගැන්වීම - සුභවාදි ආකල්ප ඇතිකිරීම,මනෝ සාමාජීය ගැටළු විසඳීම, පුද්ගල ජීවිත අගය වැඩිකිරීම, යහසමාජීය චර්යා සංවර්ධනය, නිර්මාණශීලි චින්තන රටාවක් ඇතිකිරීම , නායකත්ව කුසලතා ඇතිකිරීම හා අභියෝග ජයගැනිමේ හැකියාව සංවර්ධනය කිරීම යන ක්ෂේත්‍රයන් සංවර්ධන කිරීමට අපේක්ෂා කරයි.

2. ආර්ථික සවිබලගැන්වීම - ජීවනෝපාය සංවර්ධනය, ව්‍යවසායකත්ව සංවර්ධනය, කුසලතා සංවර්ධනය වෘත්තිය මාර්ගෝපදේශකත්වය වැනි අංශයන් දියුණු කර ප්‍රතිලාභින්ව ඵලදායී ආර්ථික කාර්යයකට යොමු කිරීමත්, තිරසාර ආදායම් මාර්ග ඇතිකර දිම හා ආදායම් මට්ටම ඉහල නැංවීම සඳහා උපකාරි වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

3. සමාජීය සවිබලගැන්වීම - පුද්ගල චර්යාවන් සංවර්ධනය ඇතිකිරීම, පවුල් ඒකකවල අභ්‍යන්තර ගැටළු අවම කිරීම, ගෘහ කළමණාකරණය, සතුටු පවුල් ඒකක ගොඩනැගීම හා නීතිමය බලගැන්වීම වැනි අංග වලින් ශක්තිමත් කිරීමට අපේක්ෂා කෙරේ.

**08. ආසියානු සංවර්ධන බැංකු හා ලෝක බැංකුව මූල්‍යාධාර යටතේ යෝජිත නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.**

- සවිබලගැන්වීමේ වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා, නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සුදුසු බව ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව යෝජනා කර ඇත.
- ඒ අනුව, 2024 වර්ෂයේ දී ආසියානු සංවර්ධන බැංකු හා ලෝක බැංකුව මූල්‍යාධාර යටතේ දිස්ත්‍රික්ක 25 හි පවුල් 16,000 ක් නියෝජනය වන පරිදි තෝරා ගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හා ග්‍රාම නිලධාරී වසම්වල නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නියමිතය.
- මෙම නියමු ව්‍යාපෘතිය සඳහා සුදුසු ප්‍රදේශ තෝරා ගැනීමේදී, දරිද්‍රතා අනුපාතය හා අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ලබන පවුල් සංඛ්‍යාව යන කරුණු පදනම් කර ගනි.
- මෙම සම්බන්ධව වැඩි විස්තර, ඉදියේදි දි නිකුත් කරන බවත් දන්වමි.

**09**. අස්වැසුම ප්‍රතිලාභින් ආර්ථික සවිබලගැන්විම යටතේ, ජීවනෝපාය සංවර්ධනය සඳහා මූල්‍යාධාර හෝ වෙනත් පහසුකම් සැලසීමට අවශ්‍ය සහාය විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ ලබා ගත හැක. මේ සඳහා මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ අංක MF/02/2023 දරණ 2023.12.29 දිනැති චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කරන ලෙසත් දන්වමි.

**10.** සවිබලගැන්වීම් වැඩසටහන යටතේ, ආර්ථික/මානසික/සාමාජීය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ග්‍රාමීය/ප්‍රාදේශීය / දිස්ත්‍රික්ක මට්ටමින් මෙහෙයුම් හා අධීක්ෂණ කමිටු පිහිටුවීම, තොරතුරු/ප්‍රගති ලබාගැනීම ඇතුළු අනෙකුත් කරුණු සම්බන්ධව ඉදිරියේදී දැනුවත් කරන බව දන්වමි.

**11.**මෙම වැඩසටහන 2024.03.01 දින සිට ආරම්භ කලයුතු බව ද දන්වමි.

**12.**මෙම වැඩසටහන පිළිබඳ තවදුරටත් විමසීම් සඳහා සැලසුම් හා මෙහෙයුම් අංශයේ පහත දුරකතන අංක හා විද්‍යුත් ලිපිනය හරහා සිදු කරන ලෙස දන්වමි.

**දුරකතන අංකය - 011-2889000**
**විද්‍යුත් ලිපිනය - dirpm123@gmail.com**

**13.**දශක 03 ට ආසන්න කාලයක් පුරා සමෘද්ධි ප්‍රතිලාභීන් හා අඩු ආදායම්ලාභීන්ගේ දුප්පත්කම අවම කිරීම සම්බන්ධව, විවිධ වූ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුලින් ඔබ ලබාගත් අත්දැකීම්, කුසලතා හා දැණුම මෙම වැඩසටහනට කැපකරනු ඇතැයි අපේක්ෂා කරමි. තවද, මෙම කාර්යයට ප්‍රමුඛතාවය දී මෙහි සඳහන් අරමුණු ජයගැනීමට කටයුතු කරන ලෙස ද දන්වමි.

**මෙම වැඩසටහන සාර්ථක කර ගැනීමට, ඔබ සැම දක්වන සහාය ඉතා අගය කොට සලකමි.**

**සී.ඩී කළුආරච්චි,**
**අධ්‍යක්ෂ ජනරාල්.**

පිටපත්:

| | |
|---|---|
| 01.ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය,කොළඹ | - කා.දැ.ස |
| 02.ලේකම්, කාන්තා,ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | - කා.දැ.ස |
| 03. අධ්‍යක්ෂ ජනරාල්,ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව | - කා.දැ.ස |
| 04. අධ්‍යක්ෂ ජනරාල්,ජාතික අයවැය දෙපාර්තමේන්තුව | - කා.දැ.ස |
| 05. විගණනකාධිපති, ජාතික විගණක කාර්යාලය | - කා.දැ.ස |
| 06. අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | - කා.දැ.ස |
| 07. ප්‍රධාන ගණකාධිකාරි, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | - කා.දැ.ස |
| 08.අධ්‍යක්ෂ, උපදේශන අංශය, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | - කා.දැ.ස |
| 09. අධ්‍යක්ෂ , ග්‍රාම සංවර්ධන, පුහුණු හා පර්යේෂණ ආයතනය | - කා.දැ.ස |
| 10. අධ්‍යක්ෂ ජනරාල්,ජාතික සමාජ සංවර්ධන ආයතනය | - කා.දැ.ස |
| 11. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | - අ.ක.ස |
| 12. සියළුම අංශ ප්‍රධානින්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | - අ.ක.ස |
| 13.සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති කළමණාකරුවන් | - දැ.ස හා අ.ක.ස |
| 14. සියළුම සමෘද්ධි බැංකු කළමනාකරුවන් | - දැ.ස හා අ.ක.ස |
| 15 ග්‍රාම නිළධාරි වසම හි සේවයේ නියතු සමෘද්ධි සංවර්ධන නිළධාරින් | - දැ.ස හා අ.ක.ස |
| 16. සියළුම ප්‍රාදේශිය සංවිධාන සභාපතිවරුන් | - දැ.ස හා අ.ක.ස |
| 17. සියළුම ප්‍රජාමූල සංවිධාන සභාපතිවරුන් | - දැ.ස හා අ.ක.ස |